# ආදායම් ප්‍රවේශය

ආදායම් ප්‍රවේශය යනු, කිසියම් කාලපරිච්ඡේදයක් තුළ සාධක හිමියන් නිෂ්පාදන ක්‍රියාවලියට සාධක සපයා ඉපැයූ ආදායම් මත නිමැවුම අගය කිරීමයි.

ආදායම් ප්‍රවේශය යටතේ ගණනය කරන්නේ ආර්ථිකයක සියලුම ආදායම් නොව, සාධක ආදායම් පමණි.

රටක දළ දේශිය නිෂ්පාදිතය ගණනය කිරීම සඳහා ආදායම් ප්‍රවේශය ප්‍රායෝගිකව යොදා ගන්නා ආකාරය මෙම කොටස තුළින් හැදෑරේ.

## ආදායම් ප්‍රවේශය යටතේ දේශිය නිෂ්පාදිතය ගණනය කිරීම

ආදායම ප්‍රවේශය යටතේ දේශිය නිෂ්පාදිත ගණනය කිරිමේදී සියලුම ආදායම් ඇතුළත් නොකරයි. එහිදී කුමන ආදායම් ඇතුලත් කරයිද? කුමන ආදායම් බැහැර කරයිද? යන්න හඳුනා ගැනීමට ආර්ථිකයක සිදුවන සමස්ත ආදායම් පිළිබඳ අවබෝධයක් ලබාගැනිම වැදගත් වේ. ආදායම් පහත පරිදි කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

**1. නොඉපයූ ආදායම්**

නොඉපයූ ආදායම් යනු සාධක සේවා නියුක්ත කිරිමෙන් තොරව ලබන ආදායම්ය. මේවා ඉපයීමකින් තොරව ලබන ආදායම් ලෙසද හැඳින්වේ.

උදා : සංක්‍රාම ආදායම්

මෙම ආදායම් මගින් අලුත් ආදායම් ප්‍රවාහයක් බිහි නොවන අතර, ආදායම් ප්‍රතිව්‍යාප්තියක් පමණක් සිදුකරන බැවින් මෙවැනි ආදායම් ජාතික ගිණුම් සම්පාදනයේදී බැහැර කෙරේ.

**2. ඉපැයූ ආදායම්**

ආර්ථිකයක විවිධ අංශ විසින් නිෂ්පාදන ක්‍රියාවලියට සාධක සේවා හෝ වෙනත් සේවා සපයා උපයාගන්නා ආදායමය.

උදා - ශ්‍රමය සපයා උපයාගන්නා වැටුප් ආදායමයි.
- රජය විසින් සපයන ලද විවිධ සේවාවන් සඳහා අයකරන බදු

අලුත් ආදායම් ප්‍රවාහයක් බිහිකරන මෙවැනි ආදායම් මගින් එකතුකළ අගයන් නියෝජනය කරයි. මේවා දළ දේශිය නිෂ්පාදිතය ගණනය කිරිමේදී ද සැලකිල්ලට ගනී.

නිෂ්පාදන ක්‍රියාවලිය තුළ බිහිවන ආදායම් ස්වරූප කිහිපයකි. එම ආදායම් ස්වරූප ප්‍රාථමික ආදායම් ලෙස හඳුන්වනු ලැබේ.

## ප්‍රාථමික ආදායම

ප්‍රාථමික ආදායම යනු නිෂ්පාදන ක්‍රියාවලියේ නිරතවීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ නිෂ්පාදනයට අවශ්‍යකරන වත්කම් හිමිකර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ ආයතනික ඒකකවලට ලැබෙන ආදායමයි. මෙහි ප්‍රධාන සංරචක හතරකි.

### 1. සේවක ආදායම්

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ශ්‍රමය සැපයීමෙන් ශ්‍රමිකයන් උපයාගන්නා ආදායම්ය.
මේ තුළ පහත දෑ ඇතුළත්වේ.

**මූල්‍ය දීමනා**

වැටුප් හා වේතන, නවාතැන් දීමනා, ගමන් වියදම, ආපදා දීමනා, කම්කරු වන්දි.

**ද්‍රව්‍යමය දීමනා**

ආහාර, සෞඛ්‍ය පහසුකම්, ප්‍රවාහන සේවා

**සේවායෝජකයා විසින් ලබාදෙන සමාජ සංරක්ෂණ ගෙවීම්**

අර්ථසාධක අරමුදල්, විශ්‍රාම වැටුප් ක්‍රම, රක්ෂණ සේවා

### 2. මෙහෙයුම් අතිරික්තය

මෙහෙයුම් අතිරික්තය ලෙස හඳුන්වන්නේ සමාගමික අංශය ජනනය කරන ආදායමයි.

(i) **බදු කුලී ආදායම**

බදු කුලී ආදායම යනු, භූමිය හා භූමිය සංවර්ධනය සඳහා යොදා ඇති ප්‍රාග්ධනය යන දෙකටම ලැබෙන මිශ්‍ර ආදායමකි.

උදා :- - කෘෂිකාර්මික ඉඩම් හා ස්වභාවික සම්පත් වල බදු කුලිය
- නිවාස හා වෙනත් ගොඩනැගිලි වල වාර්ෂික බදු කුලිය
- බුද්ධිමය දේපොළ (කර්තෘභාග, ස්වාධිකාර ගෙවීම්, ප්‍රකාශන අයිතිය) සහ ලැබෙන ආදායම් ද බදු කුලිය යටතට ගැනේ.

**(ii) මූල්‍ය වත්කම් ණයට ලබාදුන් ණයහිමියන්ට ගෙවිය යුතු පොලිය**

පොලිය යනු, මූල්‍ය ප්‍රාග්ධනය සැපයූ පුද්ගලයන් සඳහා ව්‍යාපාරික අංශය විසින් කරනු ලබන ගෙවීමය. මෙහිදී සැලකිල්ලට ගනු ලබන්නේ එකතු කළ අගයක් බිහිකිරීමට දායක වන ණය අරමුදල් සඳහා ගෙවනු ලබන පොලිය පමණි.

එකතු කළ අගයක් බිහිකිරීමට දායක නොවන අරමුදල් සඳහා පොලී ගෙවීම්, ජාතික ගිණුම සම්පාදනයේදී බැහැර කෙරේ.

උදා :- - පාරිභෝජනය සඳහා ගත් ණය වෙනුවෙන් පොලිය

(iii) **සමාගමික ලාභ**

සමාගමික ලාභ යනු, සංස්ථාපිත ව්‍යාපාර ආයතන විසින් උපයනු ලබන ලාභයයි. මෙම ලාභය ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

- සමාගමික ආදායම් බදු
- සමාගමික අයිතිකරුවන්ට ගෙවන ලාභාංශ
- ව්‍යාපාර සතු රඳවා ගත් ලාභ (නොබෙදු ලාභ)

**3. <u>නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු</u>**

රජයේ ප්‍රාථමික ආදායම ලෙස නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු මෙන්ම නිෂ්පාදනය හා ආනයන මත ලබාදෙන සහනාධාර සැළකේ.

**4. <u>මිශ්‍ර ආදායම</u>**

නිෂ්පාදන කටයුතු වලට ගෘහස්ථ ශ්‍රමය භාවිතා කරමින් ජනනය වන ආදායම්ය.

උදා :- ගොවින්ගේ ශුද්ධ ආදායම

අයිතිකරු විසින්ම සැපයු ප්‍රාග්ධන ශ්‍රමය, භූමිය හා ව්‍යවසායකත්වය යන සියලුම සාධක සඳහා ආදායම් මෙහි ඇතුළත් බැවින් මෙය මිශ්‍ර ආදායමක් වේ.

**<u>ආදායම් ප්‍රවේශයට අනුව වෙළෙඳ මිලට දළ දේශිය නිෂ්පාදිත ගණනය කිරීම.</u>**

ආදායම් ප්‍රවේශයට අනුව දළ දේශිය ආදායම පහත පරිදි ගණනය කළ හැකිය.

| | |
|---|---|
| - සේවක ආදායම් | xxx |
| - මෙහෙයුම් අතිරික්තය | xxx |
| - මිශ්‍ර ආදායම් | xxx |
| - නිෂ්පාදනය සහ ආනයන මත ශුද්ධ බදු | <u>xxx</u> |
| දළ දේශීය ආදායම | <u>xxx</u> |

## දළ ජාතික ආදායම

දළ දේශිය නිෂ්පාදිතයට විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම් ගැලපු පසු දළ ජාතික ආදායම ලැබේ.

දළ ජාතික ආදායම = දළ දේශිය නිෂ්පාදිතය + විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම

## වැයකළ හැකි දළ ජාතික ආදායම

වැයකළ හැකි දළ ජාතික ආදායම = දළ ජාතික ආදායම + විදේශ ශුද්ධ වර්තන සංක්‍රාම

## කුටුම්භ ආදායම

සාධක සේවා සැපයීම වෙනුවෙන් කුටුම්භ අතට ලැබෙන මුළු ආදායම් ප්‍රමාණයයි.

කුටුම්භ ආදායම් ලබාගැනිමට, දළ ජාතික ආදායමට ප්‍රධාන ගැලපීම් දෙකක් සිදුකළ යුතුය.

01. කුටුම්භ වෙතට ගලා නොයන ආදායම් බැහැර කළ යුතුය.

උදා :

- සමාජ සංරක්ෂණ දායක මුදල්
- සමාගමික ලාභ බදු
- රඳවාගත් ලාභ
- රජයේ දේපොළ ආදායම්
- ක්ෂය වීම්

02. කුටුම්භ වෙතට ලැබෙන සංක්‍රාම ආදායම් ඇතුලත් කළ යුතුය.

උදා :

- විශ්‍රාම වැටුප්
- සුභසාධක අරමුණින් දෙනුලබන ප්‍රදානයන්
- විදේශිය පෞද්ගලික සංක්‍රාම

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කුටුම්භ ආදායම | = | ශුද්ධ ජාතික ආදායම | + | කුටුම්බ සංක්‍රාම ලැබීම් | - | කුටුම්භ වෙත ගලා නොයන ආදායම් |

**වැය කළ හැකි කුටුම්භ ආදායම**

වැයකළ හැකි පෞද්ගලික ආදායම යනු කුටුම්භවලට ලැබෙන මුළු ආදායමෙන් ස්වකීය අභිමතය පරිදි භුක්තිවිඳිය හැකි ආදායමය.

එනම් කුටුම්භවලට භාණ්ඩ හා සේවා මිලදී ගැනිමට (කුටුම්භ පරිභෝජනයට) ඇත්ත වශයෙන්ම යොදාගත හැකි ආදායමයි.

කුටුම්භ ආදායමින් පෞද්ගලික ආදායම් බදු අඩු කිරිමෙන් වැය කළ හැකි පෞද්ගලික ආදායම් ලබාගත හැකිය.

වැයකළ හැකි කුටුම්භ ආදායම = කුටුම්බ ආදායම - කුටුම්බ සෘජු බදු

උදා :

**01.** කල්පිත ආර්ථිකයන් පිළිබඳ පහත සඳහන් දත්ත ඔබ වෙත ලබාදී ඇතැයි සලකන්න.

| අයිතම | වටිනාකම රු. බිලියන |
|---|---|
| වැටුප්, වේතන හා වෙනත් අතිරේක ශ්‍රම ආදායම (සේවක ආදායම) | 550 |
| වක්‍ර බදු | 120 |
| සහනාධාර | 30 |
| ගොවින්ගේ ආදායම් | 20 |
| ක්ෂය වීම් | 60 |
| පොලිය හා වෙනත් ආයෝජන ආදායම් | 90 |
| ගොවිපොළ හා සමාගමික නොවන ව්‍යාපාරික ආදායම් | 70 |
| සමාගමක ලාභ | 80 |

මෙම ආර්ථිකයේ දළ දේශිය නිෂ්පාදිතය ගණනය කරන්න.

උත්තරය

| | | රු. බිලියන |
|---|---|---|
| සේවක ආදායම් | | 550 |
| මිශ්‍ර ආදායම් (70 + 20) | 90 | |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය (80 + 90) | 170 | |
| ක්ෂය වීම් | 60 | 320 |
| | | 870 |
| නිෂ්පාදනය මත බදු - සහනාධාර (120 – 30) | | 90 |
| දළ දේශිය නිෂ්පාදනය | | 960 |

**02.** කිසියම් කල්පිත ආර්ථිකයට අදාළව සාරව ආර්ථික දත්ත පෙළක් පහතින් දැක්වේ.

(සියලම සංඛ්‍යා රුපියල් බිලියන වලිනි)

| | |
|---|---|
| වැටුප් හා වේතන | 400 |
| පෞද්ගලික ආදායම් බදු | 310 |
| ගොවීන්ගේ ශුද්ධ ආදායම් | 27 |
| පොලී ආදායම් | 38 |
| රජයේ සංක්‍රාම ගෙවීම් | 240 |
| සමාගමික ලාභ බදු | 40 |
| නොබෙදු සමාගමික ලාභ | 15 |
| ස්වයං රැකියවල යෙදීමෙන් උපයාගත් ශුද්ධ ආදායම | 30 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් ඉපැයීම් | - 20 |

පහත දෑ ගණනය කරන්න.

(i) ජාතික ආදායම ගණනය කරන්න

(ii) වැය කළ හැකි කුටුම්භ ආදායම ගණනය කරන්න

<u>**උත්තරය**</u> (රුපියල් බිලියන)

(i) **ජාතික ආදායම**

| | |
|---|---|
| සේවක ආදායම | 400 |
| - පොලී ආදායම් | 38 |
| - සමාගම් ලාභ (40 + 15) | 55 |
| මිශ්‍ර ආදායම් (30 + 27) | 57 |
| දළ දේශිය නිෂ්පාදිතය | 550 |
| + ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් | (20) |
| **ජාතික ආදායම** | **530** |

(ii) <u>**වැය කළ හැකි පෞද්ගලික ආදායම**</u>

| | | |
|---|---|---|
| ජාතික ආදායම | 530 | |
| + රජයේ සංක්‍රාම ගෙවීම | 240 | 770 |
| - කුටුම්භ වෙත ගලා නොයන ආදායම් | | |
| නොබෙදු ලාභ | 40 | |
| සමාගම් බදු | 15 | (55) |
| කුටුම්භ ආදායම | | 715 |
| - පෞද්ගලික ආදායම් බදු | | (310) |
| වැයකල හැකි කුටුම්භ ආදායම | | 405 |

**03.** එක්තරා කල්පිත ආර්ථිකයක පහත දැක්වෙන දත්ත දී තිබේ. (වටිනාකම රු. බිලියන)

| අයිතමය | වටිනාකම |
|---|---|
| සේවක ආදායම් | 225 |
| බදු කුලී | 34 |
| පොලී | 55 |
| නොබෙදූ ලාභ | 72 |
| මිශ්‍ර ආදායම් (ස්වයං රැකියා නියුතු ආදායම්) | 80 |
| ශුද්ධ අපනයන | 11 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය (ක්ෂයවීම්) | 40 |
| නිෂ්පාදනය මත වෙතත් බදු - සහනාධාර | 5 |
| සමාගමික ආදායම් බදු | 18 |
| ශුද්ධ වක්‍ර බදු | 20 |
| ලාභාංශ | 16 |
| විදේශිය ශුද්ධ ප්‍රාථමික ආදායම් | 5 |

ඉහතින් දත්ත උපයෝගි කරගෙන දළ ජාතික ආදායම ගණනය කරන්න.

**උත්තරය**

| | රු බිලියන |
|---|---|
| සේවක ආදායම | 225 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය (34 + 55 + 72 + 18 + 16) | 195 |
| මිශ්‍ර ආදායම් | 80 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 40 |
| නිෂ්පාදන මත වෙනත් බදු - සහනාධාර | 5 |
| දළ එකතු කළ අගය | 545 |
| + ශුද්ධ වක්‍ර බදු | 20 |
| වෙළඳ මිලට ද. දේ. නි | 565 |
| + විදේශිය ශුද්ධ ප්‍රාථමික ආදායම | 5 |
| දළ ජාතික ආදායම | 570 |